# සාන්ත සීමොන් සහ ජුද් අපෝස්තුළු තුමෝ
## මංගලයය

## පළමුවන දේව ප්‍රකාශනය — එපේසි 2: 19–22

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ක්‍රිස්තුස් වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල ඒකාබද්ධ ව
ශුද්ධ මන්දිරයක් සේ වර්ධනය වන්නේ ය."

එබැවින් ඔබ තවත් විදේශිකයෝ වත්, ආගන්තුකයෝ වත් නොව, ශුද්ධ වන්තයන් සමග සහකාර පුරවැසියෝ ද දෙවියන් වහන්සේගේ පවුලේ දූදරුවෝ ද වෙති. ඔබ ප්‍රේරිතයන්ගේ ද, දිවැසිවරයන්ගේ ද අත්තිවාරම පිට ඉදි කරනු ලැබ සිටින්නහු ය. එහි කොණේ ප්‍රධාන ගල නම් ක්‍රිස්තුන් වහන්සේ ම ය. උන් වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල ඒකාබද්ධ ව, සමිඳාණන් වහන්සේ තුළ ශුද්ධ මන්දිරයක් සේ වර්ධනය වන්නේ ය. උන් වහන්සේ තුළ ඔබත්, ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ වාසස්ථානය සඳහා එක් කොට ගොඩනගනු ලැබේ.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 19: 1–3

පිළිතුර : සමිඳුන් වදන් ලොව පුරා පැතිරී යන්නේ ය.

ගීය : අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ යː
ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා පාන්නේ ය.

එක් දිනක් තව දිනකට මෙපුවත කියන්නේ යː
එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.

කතාවක්, වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ නැති වුව ද
ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
“දෙවි ස්වාමිනි, අපි ඔබට ප්‍රශංසා කරමු.
ඔබ ලෝකාග්‍ර ස්වාමීන් බව ප්‍රකාශ කරමු.
ප්‍රතාපවත් අපෝස්තුළු පිරිස ඔබ වහන්සේගේ
මහිමය වර්ණනා කරති.”
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 6: 12-19

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

“ජේසුස් වහන්සේ කෙරෙන් අනුහස නික්මී ඔවුන් සියල්ලන් සුවවිණි.”

ඒ දවස්වල දී ජේසුස් වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැඟී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක. පහන් වූ කල උන් වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවා, ඔවුන් අතරෙන් දොළොස් දෙනෙකු තෝරා ගෙන, ඔවුන්ට ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක. ඔව්හු කවුරු ද යත්: උන් වහන්සේ විසින් පේදුරු යයි නම් කරන ලද සීමොන් සහ ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද ජාකොබ් සහ ජොහන් ද පිලිප් සහ බර්තොලමෙව් ද මතෙව් සහ තෝමස් ද අල්පේවුස්ගේ පුත් ජාකොබ් සහ අන්ත ජාතිවාදියා යි නම් ලත් සීමොන් ද ජාකොබ්ගේ පුත් ජූදස් සහ පසුව ද්‍රෝහියා වූ ජූදස් ඉස්කාරියොත් ද යන මොවුහු ය. උන් වහන්සේ ඔවුන් සමඟ කන්දෙන් බැස තැනිතලා බිමක නැවතී සිටි සේක: උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් මහා සමූහයක් ද, මුළු ජුදයෙන් හා ජෙරුසලමෙනුත්, තිර්හි සහ සීදොනයෙහි මුහුදුකරයෙනුත් උන් වහන්සේගේ දේශනා අසන්නට හා සිය රෝග සුව කරවාගන්නට ආ බොහෝ දෙනෙක් ද එහි වූ හ. අශුද්ධාත්මයන්ගෙන් පීඩිත වූවෝ සුව කරනු ලැබූ හ. උන් වහන්සේ කෙරෙන් අනුහස නික්ම ඔවුන් සියල්ලන් සුව කළ බැවින්, මුළු සමූහයා උන් වහන්සේගේ ඇඟට අත තබන්නට උත්සාහ කළහ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*